# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ශ්‍රී ලංකා හිරා පදනම (සංස්ථාගත කිරීමේ)

**ශ්‍රී ලංකා හිරා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

---

වන්නි දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කේ. කාදර් මස්තාන් මහතා විසින්
2015 දෙසැම්බර් මස 02 වන දින ඉදිරිපත් කරන ලදී.

(ගැසට් පත්‍රයේ පළ කළේ 2015 නොවැම්බර් මස 02 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[32 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# ශ්‍රී ලංකා හිරා පදනම (සංස්ථාගත කිරීමේ)

## ශ්‍රී ලංකා හිරා පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ශ්‍රී ලංකා හිරා පදනම " යනුවෙන් සඳහන් කරනු ලබන පදනමක්, එකී පදනමේ සාමාජිකයන් එකඟ වූ රීති අනුව ඒ පදනමේ පරමාර්ථ හා ඊට අදාළ කාරණා ඵලදායී ලෙස ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා මෙතෙක් කල් පිහිටුවා තිබූ අංක 10/18, ලේක් ඩ්‍රයිව්, කොළඹ 08. පිහිටුවා තිබූ හෙයින් ද :

එකී පදනම පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී පදනම විසින් සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින් සහ එකී පදනම සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

කෙටි නාමය.

**1.** මේ පනත 2015 අංක දරන "ශ්‍රී ලංකා හිරා පදනම" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

හිරා පදනම සංස්ථාගත කිරීම.

**2.** මෙම පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "පදනම" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා හිරා පදනමේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු බඳවා ගනු ලබන තැනැත්තන් (මෙහි මින් මතු "සංස්ථාව" කිරීම යනුවෙන් හඳුන්වනු ලබන ශ්‍රී ලංකා හිරා පදනම යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු ය. තව ද ඒ නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියලු අධිකරණවලදී නඩු පවරනු ලැබිය හැකි අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ, එය පාවිච්චි කිරීමේ, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) කාන්තාවන් හා ළමුන්ගේ සියලුම අයිතීන් ප්‍රවර්ධනය කිරීම හා වැඩිදියුණු කිරීම සඳහා ක්‍රියා කිරීම ;

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.